"සුලු දෙයක්නෙ.. මං අල්ලලා දෙන්නම්.. මිස්ට සමහර විට මේන් රෝල් එකම ලැබෙන්න ඉඩ තියෙනවා.. ඉන්ඩකො.. මං ටක් ගාලා එන්නම්.." කුමාර බන්දේසිය ද රැගෙන ආපසු හැරුණේ ය. නිෂාධි තවත් යමක් කියන්නට පෙරම ඔහු හෝටලය තුළට දුව ගියේ ය.

ජීවිතය කොයි තරම් සුන්දර දැයි ඇයට එක නිමේෂයකට සිතුණි. ඔස්ට්‍රේලියාවේ ගෙවන ඒකාකාරී ජීවිතයත් මේ ජීවිතයත් අතර ඇති අහස හා පොළොව මෙන් වූ වෙනස ඇයට මැනැවින් දැනෙයි. මේ සුන්දරත්වය විඳගන්නට දිලීප නොසිටීම කණගාටුවකි. සිටියද ඔහුගේ ඇසට මේ සුන්දරත්වය නොපෙනෙන බව නියත ය.

ජීවිතය පිළිබඳව නිතර නිතර දැනෙන හිස් බව මේ මොහොතේද ඇයට දැනෙමින් තිබුණි. දිලීප පිළබඳ කල්පනා කරන විට ඇයට දැනුණේ දැඩි කණගාටුවකි. ඔහු හා එක්වුණ යුගය ගීතයක් සේ සුන්දර ලෙස තවමත් ඇයට දැනෙයි. මේ මොහොතේත් ඔහු විශ්වවිද්‍යාලයේ කාමරයක් තුළට වී පොත් ගොන්නකට යටවී සිටිනු ඇති බව ඇයට විශ්වාස ය. සුළඟක් සේ ඔහු වටා දැවටෙන්නට ඇයට අවශ්‍ය විය. ඒ සුවය ඔහුට ඇවැසි නැතී සේ ය.

"මාස දෙකක් ඇතුළත මේ තීසිස් එක මං ලියල ඉවර කරන්න ඕනෙ නිෂා.. ඔයා කැමති නං මෙදා පාර ඔයා තනිවම ලංකාවට ගිහින් එන්න.. නැත්නම් ඔයාට තරහා යාවි..." දිලීප කියන්නේ හැඟීම් විරහිතව ය.

"ඇයි මං තරහ වෙන්නෙ...?"
"මට මේ මාසෙ දෙකේ ටිකක් වැඩියෙන් වැඩ කරන්න වෙනවා.. ගෙදර එන්න රෑ වෙයි.. ඔයාට තනිවම ඉන්න වෙයි.. ඔයාට බය හිතෙයි.. එතකොට තරහත් යයි.."

"ඉතින් ඔයා හැමදාම එහෙමනෙ ජීවත් වෙන්නෙ.. මේ මාස දෙකේ කියලා වෙනසක් මට නම් පේන්නෙ නැහැ..".

"ඔයා සතුටෙන් නෙවෙයි නේද ඉන්නෙ.. ?"
ඔහු මේ අසන්නේ මෙයට පෙර සිය දහස් වාරයක් ඇසූ ප්‍රශ්නයකි.

"උත්තරෙත් ඔයා දන්නවනෙ.. "

"ඒ නිසා තමයි මං හිතුවෙ පොඩි චේන්ජ් එකකටත් එක්ක ඔයාට ලංකාවට ගිහින් එන්න දෙන්න.. ඔයා කණගාටුවෙන් ඉන්න-කොට ඒක මගේ හිතට බරක්.. යන්න.. ලංකාවට ගිහින් ටිකක් සතුටු වෙලා එන්න.. එතකොට ආයෙම කාලයක් මගේ බෝරිං ලයිෆ් එක ඇතුළට වෙලා ඉන්න හිත හැදෙයි.." ඔහු සිනාසෙයි. කලාතුරකින් දකින ඒ සිනාව අව්‍යාජ බව නිෂාධි දනියි.

"මං ආපහු එන්නෙ නෑ..." ඔහු රිදවිය යුතු යයි ඇයට සිතුණි.
"ඔයා ආපහු එන බව මට ඉර හඳ වගේ විශ්වාසයි.. "
"නෑ.. මං එන්නෙ නෑ..."

"නාවොත් මේ තීසිස් එක බාර දීලා ඉවර වුණ ගමන් මං එනවා ඔයාව හොයාගෙන.. "
"මොකටද..?"
"මට ඔයා ඕනෙ නිසා..."
"මොකටද...? ලෝකෙට පේන්න ෂෝ එකට තියාගන්න...?"
"ඇයි එහෙම හිතන්නෙ...? ලෝකෙ දිහා ඕනෑවට වඩා බොළඳ විදිහට බලන්න එපා.. එතකොට අවශ්‍යතා වැඩියි... හරවත් විදිහට ජීවත් වෙන්න උත්සාහ කරන්න..."

"නෑ.. මං කැමතියි බොළඳ වෙන්න.. ලෝකෙ අනික් හැමෝම වගේ බොළඳ වෙන්න.. මට අමුතු චරිතයක් වෙන්න ඕනෙ නැහැ... ඔයාට තේරෙන්නෙ නැද්ද අපි දෙන්නා අහසට පොළොව වගේ දුරයි කියලා..."

"මට එහෙම හිතෙන්නෙ නැහැනෙ... මට පේන්නෙ ඔයා හයක් හතරක් නොතේරෙන පොඩි දරුවෙක් වගෙයි..."





*"ඒ කියන්නෙ මං කැමති වුණත් නැති වුණත් මට ලංකාවට යන්නම වෙනවා...? " නිෂාධි සිය කෝපය සඟවාගන්නට උත්සාහ නොකරම ඇසුවා ය.*

"ඔයා එහෙම හිතන බව මං දන්නවා.. ඒකට තමයි මම කැමති නැත්තෙ.. මාත් ආසාවල් බලාපොරොත්තු පොදි බැඳ ගත්ත වෙනමම ජීවියෙක් ... ස්වාධීන ජීවියෙක් කියන එක ඔයාට තේරෙන්නෙ නැහැ.. මං කැමති නැහැ බබෙකුට වගේ මට සලකනවට..."

"ඕන්න ළමයට තරහා යාගෙන එනවා... ඒකනෙ මං කිව්වේ... ඔන්න මං ඔයාට ටිකට් එකත් බුක් කළා.. ගිහිල්ලා මාසයක් දෙකක් ඉඳලා එන්න.. අපි මේ ගෙවන ජීවිතේ කොයි තරම් ෂෝක් ද කියලා මාස දෙක යනකොට ඔයාට තේරේවි.."

"ටිකට් බුක් කලා...?" නිෂාධි විමතියට පත් විය. "ඇයි මගෙන් අහන්නෙ නැතිව ටිකට් බුක් කළේ...?"
පිළිතුරක් දෙනු වෙනුවට දිලීප නැවත දෙනෙත් පොත වෙතට යොමු කර ගත්තේ ය. ඔහුගේ නිහඬ බව ඇගේ සිතේ ඇති කළේ කෝපයකි.

"ඒ කියන්නෙ මං කැමති වැණත් නැති වුණත් මට ලංකාවට යන්නම වෙනවා..."
නිෂාධි සිය කෝපය සඟවාගන්නට උත්සාහ නොකරම ඇසුවා ය.

"මේ මාස දෙක මට හරිම වැදගත් නිෂා..."
පිළිතුරක් ලෙස ඔහු පැවසුවේ එපමණකි.

"ඔයා මහ කපටියෙක්.." නිෂාධි කෝපයෙන් මිමිනුවා ය. තමා ලංකාවට යවන්නට සියල්ල සූදානම් කරන තුරු නිශ්ෂබ්දව සිටි ඔහු පිලිබඳව ඇගේ සිත තුළ මතුව එන්නේ දැඩි කෝපයකි. ඔහුගේ ආදරය තුළ තමා සිරකාරිකව සිටින බවක් නිෂාධිට හැඟෙයි.

"උඹ කොච්චර බර කල්පනාවක හිටියද කිව්වොත් අපි එනවා වත් දැක්කෙ නැහැ නේද..?" පවිත්‍රා නිෂාධි ඉදිරියේ වූ සැප අසුනේ වාඩි වන අතර කීවා ය. ".. කෑම කෑවෙ නැද්ද තාම..? "
"කොහෙ කන්නද .. මං ඉතින් උඹලා දෙන්නා එනකල් හිටියා.. "
"මහන්සියට පොඩ්ඩක් ඇළ වුණා.. එහෙමම නින්ද ගියා.. "

"යමු එහෙනං කන්න.. නිෂාධිට දැන් හොඳටම බඩගිණි ඇති.."
නුවරඑළියේ රාත්‍රිය සුපුරුදු පරිදි සීතලෙන් වෙළෙමින් ඇත. තව දුරටත් උද්‍යානයට වී සිටින්නට නොහැකි තරමට අනුරාධ සීතලෙන් වෙවුලුවේ ය. බොමින් සිටි බීර බෝතලයේ අවසන් උගුර කටට හළා ගත් අනුරාධ අසුනින් නැගිට්ටේ ය. සීතල නිසා දෝ බඩගින්නක් දැනෙයි. ඉක්මනින් යමක් කා ඇඳට වැටෙන්නට ඔහු සිතුවේ ය.

ආත්‍රි ආහාරය කාමරයටම ගෙන්වා ගන්නට පළමුව සිතුණ ද අනුරාධ දෙවෙනුව ඒ අදහස ඉවත් කර ගත්තේ ය. කෑම ශාලාවට ගොස් කෙළවර අසුනක වාඩි වී නිවී සැනසිල්ලේ ආත්‍රි ආහා-රය ගත යුතු යයි ඔහුට සිතුණි. බුෆේ ක්‍රමයට සකස් කර තිබූ කෑම මේසය ඔහුගේ බඩගින්න වැඩි කළේ ය. සුප් කෝප්පයක් වත්කරගත් අනුරාධ ශාලාවේ සිසාරා බැල්මක් හෙළුවේ ය. ශාලාවේ කෙළවරක මේසයක තනිවම ආහාර ගනිමින් සිටි යුවතිය ඔහු දුටුවේ ය.

අනුරාධ ගේ හදවත මොහොතකට නැවතුණා සේ විය.
.. නිෂාධි...?? මේ ඇය නොවේ ද..?

ළබන කලාපයට

## "ඕනම කර තිබේ""

ගුණවත්ය, කුලවත්ය.
පෙළපතම උගතුන්ය.
සමාජයෙ අති ඉහල
පරපුරක දියණියට
ගෝදොරද වතුපිටිද
යාන වාහන සමග
මිල මුදල්සාගරය
නිත තින්ම හිමි උනත්
ජීවිතය තුරාවට
වැඩිහිටි කිසිවෙකුට
කිසිම දින කිසිම විට
වාදයට නොකියවන
විලුඹ තෙක්දිගු වරල
මොණර පිල්පරදවන,
නීල නෙතු සම වන්න
උපමාව න තත් සම...
රාජ කුමරී යො නොම ත
ඒ මුහුණ පරදන්න....
කිසිම දින කිසිම විට
බාල්න ටුමට නොයන
එකම එක දියණියට
මව් පියන් සොයනවා
ආදරය හදුනනා
උගත් ගුණවත් පුතෙක්
ගැලපෙයිද ඔබ පුතුට..? ? ?

පඃ ලි
උපතින්ම ගොලුය ඇය
දෙපා අභිමිය ඇයට
ගැලපෙයිද ඔබ පුතුට ????

**අසෝකා දේවසුරේන්ද්‍ර**
ප්‍රංශය

